# පුරප්පාඩු

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

### දුම්බර හරිත සවිබල ගැන්වීමේ (GCF නකල්ස්) ව්‍යාපෘතිය

### ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

---

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ GCF නකල්ස් ව්‍යාපෘතිය සඳහා රජයේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිවලට අනුව පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමක් මත ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් සහ කැපවූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රධාන වශයෙන් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 39.7 ක දායකත්වයක් සහ දේශීය මූලාශ්‍රවලින් අතිරේක ඇමරිකානු ඩොලර් මිලියන 9.2 ක දායකත්වයක් ලබා සෙන මෙම ව්‍යාපෘතිය 2029.01.16 දක්වා දිස්ත්‍රික්ක පහ පුරා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

තනතුරේ වැටුප 2019/03/15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ 01/2019 අනුව වේ. මෙය මුදල් අමාත්‍යාංශය මගින් යාවත්කාලීන කිරීමට නියමිතයි.

**ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පුරප්පාඩු - කොළඹ**

| අනු අංකය | PS කාණ්ඩය | තනතුර | තනතුරු ගණන | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 2 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | MSD චක්‍රලේඛය 1/2019 |
| 02 | PS 3 | නියෝජ්‍ය ව්‍යාපෘති විශේෂඥ | 01 | |
| 03 | PS 5 | ව්‍යාපෘති ලේකම් | 01 | |
| 04 | PS 5 | තොරතුරු කළමනාකරණ නිලධාරී | 02 | |

**කලාප කාර්යාල (නාවුල/දිගන/ලග්ගල) පුරප්පාඩු**

| අනු අංකය | PS කාණ්ඩය | තනතුර | තනතුරු ගණන | | | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|---|---|
| | | | නාඋල | ලග්ගල | දිගන | |
| | | | මල්වතු ඔය, යාන් ඔය ජල පෝෂක ප්‍රදේශ සහ හුරුළු වැව පහළ ගංගා ද්‍රෝණි | කලා ඔයජල පෝෂක ප්‍රදේශ | නැගෙනහිර බෑවුම ජල පෝෂක ප්‍රදේශ (විල්ගමුව, මිනිපේ, උඩුදුම්බර) | |
| 01 | PS 3 | කලාප කළමනාකරු | 1 | 1 | 1 | MSD චක්‍රලේඛය 1/2019 |

අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය මෙන්ම රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුකම සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවා පලපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

වැඩිදුර තොරතුරු සඳහා, **www.irrigationmin.gov.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

2025 ඔක්තෝබර් 06 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂක
GCF නකල්ස් ව්‍යාපෘතිය
10 වන මහල, අංක 500, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ටී.බී. ජයා මාවත, කොළඹ 10

කෙටි ලැයිස්තු ගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේපක කරනු ලැබේ.

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

දිනය: 2025.09.18

# පුරප්පාඩු

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
## ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ යැපුම් ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය
## දුම්බර හරිත සවිබල ගැන්වීමේ (GCF – නකල්ස්) ව්‍යාපෘතිය
## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම
## පස් අවුරුදු කාලය (2029.01.16 දක්වා)

නකල්ස් කඳුවැටි ප්‍රදේශයේ කෘෂිකාර්මික, ග්‍රාමීය සහ වතු ප්‍රජාවන්ගේ දේශගුණික විපර්යාස බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද GCF නකල්ස් ව්‍යාපෘතිය, එහි ව්‍යාපෘති ප්‍රදේශය තුළ තිරසාර ඉඩම් කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට ද කැපවී සිටී.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය මාතලේ, මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක ක්‍රියාත්මක වන අතර මධ්‍යම, උතුරු මැද සහ වයඹ පළාත්වල තීරණාත්මක ජල පෝෂක ප්‍රදේශ, ගංගා සහ කෘෂිකාර්මික ප්‍රජාවන් ආවරණය කරයි. මෙම මැදිහත්වීම මෙම ප්‍රජාවන්ගේ තිරසාර ජීවනෝපායන් සහතික කිරීමට උත්සාහ කරයි.

එපමණක් නොව, මහජන සහභාගීත්ව ප්‍රවේශයක් හරහා, මෙම ව්‍යාපෘතිය තිරසාර ඉඩම් සහ ජල කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීමට, නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීමට සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීමට දායක වේ. මෙය GCF, ICRAF සහ IUCN වැනි ප්‍රධාන කොටස්කරුවන් සමඟ සහ බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ සහයෝගයෙන් සිදු කෙරේ.

ප්‍රධාන වශයෙන් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 39.7 ක දායකත්වයක් සහ දේශීය මූලාශ්‍රවලින් අතිරේක ඇමරිකානු ඩොලර් මිලියන 9.2 ක දායකත්වයක් ලබා දෙන මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක පහ පුරා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

දිස්ත්‍රික් පාදක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක තුනක ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට අනුකූලව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, ඒ අනුව ගෙවීම් සිදු කරනු ලැබේ .

**01.** නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ **(PS 2) –** තනතුරු **- 01**

වැටුප් මට්ටම : රු. **135,000.00 – 150,000.00** (MSD චක්‍රලේඛ අංක: 01/2019 අනුව)
අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද
**I** හෝ **II** හෝ **III** හෝ **IV** පහතින්

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද මූලික උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සහ අවම වශයෙන් වසර 07 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. ඉන් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය;

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද ප්‍රථම උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්;

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 02 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය;

IV. රජයේ සමස්ත දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්වයක්;

**සමග**

1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්ද.

**02. සන්නිවේදන විශේෂඥ (PS 3) – තනතුරු - 01**

**03.** කලාප කළමනාකරු – තනතුරු - **03 (PS 3)** (කලාප කාර්යාලය නාඋල/දිගන/ලග්ගල)

වැටුප් මට්ටම: රු. **125,000.00 – 140,000.00** (MSD චක්‍රලේඛ අංක: 01/2019 අනුව)

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද**

**I හෝ II හෝ III පහතින්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද මූලික උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සමග**

කළමනාකරණ මට්ටමින් සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු 08 ක පළපුරුද්ද

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද ප්‍රථම උපාධියක්.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සමග**

කළමනාකරණ මට්ටමින් සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු 07 ක පළපුරුද්ද

III. රජයේ සමස්ත දීප ව්‍යාප්ත සේවාවක I පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්වයක්;

**සමග**

I පන්තියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්ද.

**4.** ව්‍යාපෘති ලේකම් **(PS 5)** – තනතුරු - **01**

**5.** තොරතුරු කළමනාකරණ නිලධාරී **(PS 5)** – තනතුරු - **02**

වැටුප් මට්ටම: රු. **75,000.00 – 81,000.00** (MSD චක්‍රලේඛ අංක: 01/2019 අනුව)

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද**

**I හෝ II හෝ III පහතින්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**හෝ**

තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම ;

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්ද.

II. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම ;

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 08 ක පළපුරුද්ද

III. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම ;

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 13 ක පළපුරුද්ද;

සාමාන්‍ය කොන්දේසි

- ❖ වයස අවුරුදු 62 ට අඩු විය යුතු අතර, PS 2, 3 සහ 5 දක්වා වැටුප් කේත පරාසයන් 01/2019 සහ 2019/03/15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ දක්වා ඇති කොන්දේසි වලට යටත් වේ.

- ❖ මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අතර, කෙටි ලැයිස්තුගත කර ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණවල ප්‍රතිඵල මත පදනම්ව පුරප්පාඩු සඳහා පත්වීම් සිදු කරනු ලැබේ.
- ❖ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල වැඩ කිරීමේ පළපුරුද්ද, ව්‍යාපෘති කළමනාකරණය, මෙහෙයුම් සහ ඇගයීම පිළිබඳ සුදුසුකම්, සන්නිවේදනය සහ වාර්තා ලිවීමේ කුසලතා ඇතුළුව ඉංග්‍රීසි/සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාවය, ප්‍රකාශන/පර්යේෂණ පත්‍රිකා පිළිබඳ පළපුරුද්ද සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය ලෙස සැලකේ.

- ❖ අතිරේක සුදුසුකම් අතරට දේශගුණික විපර්යාස, ප්‍රජා පාදක ක්‍රියාකාරකම්, ග්‍රාමීය සංවර්ධනය, කෘෂිකර්මාන්තය සහ වැවිලි අංශ, පාලනය සහ පාරිසරික කළමනාකරණය වැනි ව්‍යාපෘතිය මගින් ආවරණය වන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇතුළත් වේ.
- ❖ රාජ්‍ය අංශයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් පසුගිය වසර 3 තුළ සතුටුදායක සේවා කාලයක් (විනය පරීක්ෂණවලින් තොර) සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය. තවද, තෝරා ගනු ලැබුවහොත්, ව්‍යාපෘතියට නිලධාරියා මුදා හැරීමට එකගතාව පලකරන බවට ආයතනික ප්‍රධානියා විසින් අයදුම්පත සහතික කළ යුතුය.

තෝරාගත් නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා ව්‍යාපෘතියට අනුයුක්ත කරනු ලබන අතර, කාර්ය සාධන ඇගයීම් මත පදනම්ව වාර්ෂිකව සේවා දීර්ඝ කිරීමේ හැකියාව ඇත.
වැටුප් කේතය PS 3 -කලාප කළමනාකරුවන් බඳවා ගැනීම් සඳහා - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
කෙසේ වෙතත්, තෝරාගත් අපේක්ෂකයින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ව්‍යාපෘති අවශ්‍යතා අනුව අවශ්‍ය ඕනෑම උප කාර්යාලයක සේවය කිරීමට කැමැත්තෙන් සිටිය යුතුය.
2025 ඔක්තෝබර් මස 06 වන දින හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**GCF නකල්ස් ව්‍යාපෘතිය,**
**10 වන මහල,**
**අංක 500, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ටී.බී. ජයා මාවත, කොළඹ 10**

සටහන:
බඳවා ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් කිරීමට දරන ඕනෑම උත්සාහයක් නුසුදුස්සෙකු වීමට හේතු වේ.

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය